# දේශීය ආදායම් දිරි දීමනා අරමුදල - 2011

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරි දීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

2012 මාර්තු 28 දිනැති ලිපිය පරිදි ස්ථාවර වත්කම් යටතේ මේස පන්දු මේස 01 ක් හා වානේ අල්මාරි 3 ක් ඇති බව සඳහන් කර තිබුණු නමුත් එම වත්කම්, අරමුදල යටතේ වූ රු. 5,529,194 ක් වූ ස්ථාවර වත්කම් වලට ඇතුලත්ව නොතිබුණි.

#### 1.2.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිරි දීමනා අරමුදල යටතේ පැවති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිවාස ප්‍රතිලාභ ක්‍රමය ආරම්භකර තිබුණි. එහි අරමුදලේ වර්ෂය අවසානයට රු.28,245,671 ක ශේෂයක් පැවතුණද ණය ගෙවීමෙන් පසු එදිනට උකස් හා ආයොජන බැංකුවේ ශේෂය රු.8,478,432 ක් විය.

(ආ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2010 දෙසැම්බර් මාසය සඳහාවූ ගිණුම් ප්‍රකාශය අනුව දේශීය ආදායම් නිවාස අරමුදලෙහි 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 10,494,141 ක් වුවත් 2011 ජනවාරි මාසය සඳහා ඉදිරිපත් කර තිබුණු ගිණුම් ප්‍රකාශය අනුව 2011 ජනවාරි 01 දිනට එහි ශේෂය රු.12,021,499 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.1,527,358 ක වෙනසක් පැවතුණි.

#### 1.2.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

රු.5,109,075 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි, දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි.

### 1.2.4 නීති රීති යනාදියට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/423 හි 03.2 ඡේදය ප්‍රකාර ක්‍රියාත්මක නොවන අරමුදල් වසා දැමීමට කටයුතු කල යුතු වුවත් 2006 වර්ෂයේ සිට දිරි දීමනා වැය ශීර්ෂ ප්‍රතිපාදන වලින් ගෙවීම් කිරීම හේතුවෙන් දේශීය ආදායම් දිරි දීමනා අරමුදල ක්‍රියාකාරී අරමුදලක් ලෙස නොපැවතියද එම අරමුදල වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

## 2. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

දේශීය ආදායම් නිවාස ප්‍රතිලාභ ක්‍රමය යටතේ දෙන ලද ණය සහ අයකිරීම් ඇතුලත් ගිණුම් ක්‍රමයක් සකස් කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නිවාස ප්‍රතිලාභ ක්‍රමයේ ණය පාලනය

(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය.

(ඇ) අරමුදල වසා දැමීමේ ක්‍රියාපර්පාටිය.